**ඔපෙක් අරමුදලින් කොළඹ ජාතික මහා මාර්ග පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2021**

ඔපෙක් අරමුදලින් කොළඹ ජාතික මහා මාර්ග පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට වරාය, නාවික කටයුතු හා මහා මාර්ග අමාත්‍යාංශය වර්තමානයේ ප්‍රවාහන සහ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කොළඹ තදාසන්න ප්‍රදේශවල ප්‍රධාන ජාතික මාර්ග 13ක කිලෝමීටර් 65.45ක් වැඩිදියුණුකිරීම හා නාරාහේන්පිට- නුගේගොඩ පාලම ප්‍රතිසංස්කරණය කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 11,212.37කට සමාන එ.ජ.ඩො. මිලියන 86.25ක් වන අතර ඉන් රු. මිලියන 6,499.57කට සමාන එ.ජ.ඩො.මිලියන 50ක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 දෙසැම්බර් 11 දින ආරම්භ කරන ලද අතර 2017 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිත විය. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු නිමකිරීමේ දිනය 2022 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

මාගේ වාර්තාවේ 2.1 වගුවේ දැක්වෙන කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු | මුදල රු.මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිරීක්ෂණ |
|---|---|---|---|---|
| (අ) | දැනටමත් ප්‍රතිලබ්ධි කරන ලද මුදල මූල්‍ය ප්‍රකාශනවල විදේශාධාර යටතේ වාර්තා කිරීම වෙනුවට ප්‍රතිලබ්ධි කළ හැකි විදේශාධාර යටතේ දක්වා තිබුණි. | 525 | ව්‍යාපෘතියේ ආරම්භක අදියරේ සිට ණය මුදලින් කරන ලද ප්‍රතිලබ්ධීන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ වාර්තා මත පදනම්ව ගිණුම්ගත කර තිබුණි. එය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ වාර්තාවල නොතිබීම හේතුවෙන් රු.මිලියන 525ක මුදල ප්‍රතිලබ්ධි කළ හැකි විදේශාධාර ගිණුමේ වාර්තා කර ඇත. | 2021 දෙසැම්බර් 31 දිනට නිවැරදි ණය ශේෂය දැක්වීම සඳහා ව්‍යාපෘතියේ සත්‍ය ප්‍රතිලබ්ධි කරන ලද මුදල වාර්තා කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | වල්ගම-දියගම මාර්ගයේ ඉඩම් හිමිකරුවන් සඳහා රුපියල් මිලියන 239ක ව්‍යවස්ථාපිත වන්දි ගෙවීම් ප්‍රමාදය සඳහා ගෙවිය යුතු පොළිය 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල වාර්තාකර නොතිබුණි. | 88.00 | සටහන් කර ගන්නා ලද අතර 2022 වර්ෂයේ වල්ගම-දියගම මාර්ගය සඳහා පොළී වෙන්කිරීම් ගිණුම්ගත කිරීමට පියවර ගනු ලැබේ. | 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු පොළී ගිණුම් නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | ඔරුගොඩවත්ත අඹතලේ මාර්ගය අදියර- 1 2021 දෙසැම්බර් මාසය සම්බන්ධ අතුරු ගෙවීම් සහතික අංක 24 සඳහා කරන ලද වැරදි වෙන්කිරීම් හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන්ගේ ගෙවීම් ගිණුම අඩුවෙන් දක්වා තිබුණි. | 10.56 | ඔරුගොඩවත්ත අඹතලේ මාර්ගය අදියර-1 හි 2021 දෙසැම්බර් මාසය සඳහා යොමුගත අතුරු ගෙවීම් සහතිකය මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමෙන් පසු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය වෙත ලැබී තිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට නිවැරදි වගකීම වාර්තා කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලැබුණු දිගුකාලීන ණය මුදල ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. කෙසේවෙතත්, අනුරූපී වටිනාකම මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 1,478 | - | ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන ඒකකයේ මූල්‍ය ප්‍රකාශන සමග අනුකූල විය යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳව භෞතික හා මූල්‍ය ප්‍රගතිය

| සංරචකය | 2021 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික කාර්යසාධනය ප්‍රතිශතය | අත්කරගත් කාර්යසාධනය ප්‍රතිශතය | විගණන ගැටලු | ප්‍රමායන් සඳහා හේතු |
|---|---|---|---|---|
| කොට්ටාව- තලගල මාර්ගය | 100% | 97.5% | ව්‍යාපෘති කටයුතු 2013 දෙසැම්බර් 11 දින ආරම්භ කර 2017 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණද 2021 දෙසැම්බර් 31 දිනට ජාතික මාර්ග 06ක කිලෝමීටර 24.07ක පුනරුත්ථාපන කටයුතු සහ පාලම වැඩිදියුණු කිරීම පමණක් නිමකර තිබුණි. | ඉඩම් අත්කර ගැනීමේ ප්‍රමාදය සහ උපයෝගීතාවන් විතැන් කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් ප්‍රධාන වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතියේ ප්‍රමාසද විය. |
| ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගය (අදියර 1) | 100% | 72% | | |
| ඔරුගොඩවත්ත- අඹතලේ මාර්ගය (අදියර 1) | 66% | 64% | | |

**කළමනාකරණයේ ප්‍රතිචාර** එකගවේ. සඳහන් කොන්ත්‍රාත් සමග ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධ නොවීම නිසා ජාතික මාර්ගවල කිලෝමීටර 24.07ක් සහ නාරාහේන්පිට - නුගේගොඩ මාර්ගයේ අංක 2/1 දරන පාලම පුළුල් කිරීමේ කටයුතු සැලසුම් කළ පරිදි නිමකර තිබුණි.

**විගණකගේ නිර්දේශ** ඉලක්කගත දිනයන්ට කටයුතු නිම කිරීමට ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතුය.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | පිළිවෙලින් විදේශ ණය සහ ශ්‍රී ලංකා රජයේ වියදම් උපයෝජනය සඳහා 2021 වර්ෂයේ මහා භාණ්ඩාගාරය විසින් රු.මිලියන 1,430ක සහ රු.මිලියන 2,801ක ප්‍රතිපාදන මුදලක් වෙන්කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතුවල මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් සියයට 37ක් නියෝජනය කරන රු.මිලියන 525ක විදේශ ණය මුදලේ ප්‍රතිපාදන සහ සියයට 17ක් නියෝජනය කරන රු.මිලියන 469ක ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. | එකගවේ. විදේශ ණය ප්‍රතිපාදනවල ඌන උපයෝජන ඉඩම් අත්පත්කර ගැනීම සහ උපයෝගීතාවන් විතැන් කිරීමේ ප්‍රමාදයන් හේතුන් වේ. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ ප්‍රමාදයට කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනයත් දායකවී ඇත. අග්‍රිම නොලැබීම හේතුවෙන් ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන ඌන උපයෝජනය වී තිබේ. | ව්‍යාපෘතියේ අරමුදල් උපයෝජනයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට ව්‍යාපෘතියේ කටයුතු නිසි පරිදි සැලසුම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වයාපෘතියේ කාලය දීර්ඝ කිරීම සහ ප්‍රමාණ විචල්‍යතා හේතුවෙන් කොට්ටාව - තලගල මාර්ගයේ රු. මිලියන 1,253ක මුල් කොන්ත්‍රාත් වටිනාකම පසුව රු. මිලියන 1,630 දක්වා සියයට 30ක් නියෝජනය කරන රු. මිලියන 377කින් වැඩිවී තිබුණි. කෙසේවෙතත්, 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 8.13.4 වගන්තිය අනුව තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහ ප්‍රසම්පාදන කමිටුවේ අවශ්‍ය අනුමැතීන් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | එකගවේ. ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සහ මෙම කාර්යාලයේ පවතින ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධ වාර්තා අනුව කොට්ටාව - තලගල මාර්ගය ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් වටිනාකම සංශෝධනය කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 8.13.4 වගන්තිය අනුව අදාළ අනුමැතීන් ලබා ගැනීම අවශ්‍ය වේ. |
| (ඇ) | ඔරුගොඩවත්ත-අඹතලේ මාර්ගය අදියර- 1 හි පුනරුත්ථාපන කටයුතු සඳහා වන කොන්ත්‍රාත්තුව පිරිවැය රු මිලියන 1,528කට 2017 ජුලි 01 දින ආරම්භ කර 2019 ජුනි 30 නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, කොන්ත්‍රාත්කරුට දින 639ක කාලය දීර්ඝ කිරීමක් ප්‍රදානය කරමින් 2022 සැප්තැම්බර් 30 දක්වා අවස්ථා 5කදී ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත් කාලය දීර්ඝකර තිබුණි. කොන්ත්‍රාත්කරුගේ කාර්යසාධන වඩාත් දුර්වල සහ මන්දගාමී වුවද කොන්ත්‍රාත් කොන්දේසි අනුව කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාද හානි අඩුකර ගැනීමට ව්‍යාපෘතිය පියවර ගෙන නොතිබුණි. තවද, කොන්ත්‍රාත්කරුගේ කාර්සාධනය සැලකීමකින් තොරව ලබාදෙන ලද දින 175ක කාල දීර්ඝ කිරීමේ පිරිවැය සම්බන්ධ රු මිලියන 17.41ක හිමිකම්පෑම් ව්‍යාපෘතිය විසින් අනුමත කර තිබුණු බව නිරීක්ෂණය විය. | මෙම කාලය දීර්ඝ කිරීමේ ඉල්ලීම ඉංජිනේරුවරයා ඇගයීම් කර ඇති අතර කොන්ත්‍රාත්කරුවෙත දින 175 දීර්ඝ කිරීමක් ලබාදී ඇත. සේවායෝජකයාගේ අවධානම් සිදුවීම් සහ කොන්ත්‍රාත්කරුගේ දින 175ක වැරදි ප්‍රමාද සිදුවීම් හේතුවෙන් ව්‍යාපෘතිය දින 175ක් ප්‍රමාදවූ බව ඉංජිනේරුවරයා සිය ඇගයීම් වාර්තාවේ පැහැදිලිව දක්වා ඇත. | කාලීනව කොන්ත්‍රාත්කරුගේ කාර්යසාධනය ඇගයීම සිදුකළ යුතු අතර අවශ්‍ය අයකර ගැනීම් ලබාගත යුතුය. |

### 3.3 ඉඩම් අත්පත්කර ගැනීම සම්බන්ධ ගැටලු

| විගණන ගැටලු | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිරීක්ෂණ |
|---|---|---|
| වන්දි මුදල් නිරවුල් කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සඳහා රු.මිලියන 1,312ක පොළිය ඇතුලුව රු. මිලියන 10,998ක වන්දි මුදලක් ව්‍යාපෘති විසින් ගෙවා තිබුණි. කෙසේවෙතත්, 2021 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ ඉඩම් කට්ටි 05ක් පමණක් ලියාපදිංචි කර තිබුණි. | එකගවේ. ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 44 උපවගන්තිය අනුව වන්දි ගෙවීම් ප්‍රමාද සඳහා පොළිය ගෙවීමෙන් පසු ඉඩම් ඉඩම් රෙජිස්ටාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත. කෙසේවෙතත්,පොළී ගෙවීමට පෙර ඉඩම් ලියාපදිංචි කිරීමට මෑතකදී තීරණය කර තිබුණි. | ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතු අතර ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ ඉඩම් ලියාපදිංචි කළ යුතුය. |